කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණයේදී, මාධ්‍ය මගින් යොදාගන්නා භාෂාව මගින්ද කොවිඩ්-19 ආසාදිතයන් කෙරෙහි සමාජ ගර්හාවක් සහ සමාජය තුළ කොන් කිරීමේ හැඟීමක් නිර්මාණය විය හැකි බව අප විසින් දිගින් දිගටම පෙන්වා දී ඇත්තෙමු.

මෙහිදී "කොවිඩ් පෙම්වතා", "කොවිඩ් රාළහාමි" වැනි යෙදුම් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයින් හැඳින්වීම ඔස්සේ ඉහත දක්වා ඇති ආකාරයට සමාජය තුළ කොවිඩ්-19 ආසාදිතයින් කෙරෙහි කොන් කිරීමක් ඇති නොවන්නේදැයි අප ඇසිය යුතු වේ.

එසේම, ඉහත ආකාරයේ හැඳින්වීම් කෙතරම් ශිෂ්ට සම්පන්න වේද යන ගැටළුවද මතුවේ. සමාජය තුළ ශිෂ්ට සම්පන්න චින්තනයක් නිර්මාණය කිරීමෙහි ලා ශිෂ්ට සම්පන්න භාෂාවකට කළ හැකි කර්තව්‍යයත්, මෙම ශිෂ්ට සම්පන්න භාෂාව හැසිරවීමෙහි ලා මාධ්‍ය අත ඇති වගකීමත් අපි මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු.

කරුණු එසේ නම්, සති අග අරුණ (11/15) සහ ඉරිදා දිවයින (11/15) පුවත් වාර්තාවන්හි දැක්වෙන මෙම යෙදුම් කෙතරම් ආචාර ධර්මානුකූල වාර්තාකරණයක් හා එකඟ වන්නේද? එම යෙදුම් කෙතරම් ශිෂ්ට සම්පන්න සමාජයකට උචිත වන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?
එසේම නිවැරදි අක්ෂර වින්‍යාසයට අනුව ලිවිය යුත්තේ 'ආසාදිත' ලෙසින් බවද සඳහන් කරමු.

#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #SinhalaNews #SundayDivaina #SathiAgaAruna